# අපූරු කණ්ණාඩිය



E.M.H.G. සෙනාදි තෙසන්යා ඒකනායක

# අපූරු කණ්ණාඩිය

E.M.H.G. සෙනාදි තෙසන්යා ඒකනායක

(කතෘ)

සිතුවම් ඇඳීම- E.M.H.G. සෙනාදි තෙසන්යා ඒකනායක

අදහස- E.M.H.G. සෙනාදි තෙසන්යා ඒකනායක

කතෘ ගේ වෙනත් කෘති- දළඹු පැටියා වෙනස් වෙලා

පාසල - මහ/මහාමායා බාලිකා විදුහල

ඉගෙනුම ලබන පන්තිය - 3 D

කෘතිය පළ කරන දිනය - 2025.02.22

ISBN : 978-624-208-166-3

මාගේ ආදරණීය අම්මාටත් අප්පච්චිටත් මාගේ මේ උත්සාහය උපහාරයක් වේවා...!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමයා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථ කරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීතයතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන **"හෙරණ ගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිතිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගතදිවිය සඳහා අත්වැලක් වන නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

කැලෑවේ ඉස්කෝලෙට මී රංචුව ගියේ හරිම සතුටින්.

ඒත් ඒ විදිහට එයාලට ඉස්කෝලේ යන්න පුලුවන් වුනේ ටික දවසයි . ඒ මොකද දන්නවා ද ?

කැලෑවට ආපු පූස් තඩියෙක් හැමදාම මී පැටවු අල්ලන්න පටන් ගත්තා.




"මේ වැඩේ හරි යන්නේ නෑ. දවසින් දවස අපේ එක එක්කෙනා අඩු වෙනවා. අපි මේකට මොකක් හරි කරන්න ඕනේ" රංචුවේ ලොකුම මීයා කිව්වා .

"අපි ඉතින් මොකද කරන්නේ ?"පුංචි මී පැටියෙක් ඇහුවා.

නායක මීයාට හොඳ උපායක් ආවා. " මම ඔයාලට අදහසක් දෙන්නම්. ඔයාලා මට උදව් කරන්න ඕනේ." නායක මීයා කිව්වා.

"මෙන්න මෙහෙමයි කරන්නේ .....


අපි වළක් හාරලා එකට උඩින් කොළ අතු වහන්න ඕනේ. පූස් තඩියාවත් කොහොම හරි වළ ළගට ගෙන්න ගන්න ඕනේ." නායක මීයා විස්තර කළා.



“ඒ වගේම අපිට තව විශේෂ දෙයක් ඕනේ.”

“ඒ මොකක් ද?” තව මී පැටියෙක් ඇහුවා.

“අපිව ලොකු වෙලා පේන කණ්ණාඩියක් ඕනේ”. නායක මීයා නැවතත් කීවා.



“අපිව ලොකු වෙලා පේන කණ්ණාඩිත් තියෙනවද?”

මී පැටියෙක් පුදුමයෙන් ඇහුවා.

“ඔව් අපිව ලොකු වෙලා පේන කණ්ණාඩි තියෙනවා

කැලෑ ඉස්කෝලේ ගුරුතුමා ඒ ගැන කියලත් දුන්නා”

නායක මීයා කිව්වා.

“ආ... ඔව්. අපේ ඌරු මීයා සීයාත් රැවුල කපන්නේ ඒ වගේ කණ්ණාඩියකින් බලාගෙන..

ඒ කණ්ණාඩියෙන් සීයාගේ මූණ ලොකු වෙලා පේනවා.'' තවත් මී පැටියෙක් කිව්වා.

“එහෙනම් සීයාගෙන් කණ්ණාඩියත් ඉල්ලා ගමු.'' නායක මීයා කිවුවා.



මී රංචුවේ හැමෝම නායක මීයාගේ සැළසුමට අනුව වැඩ කළා.

හැමෝම සහයෝගයෙන් එකා වගේ එකතු වෙලා කටයුතු කළා..

ඔන්න දැන් පූස් තඩියාව අල්ල ගන්න හැම දේම සූදානම්.

මේ කට්ටියම සැළසුම ක්‍රියාත්මක කළා.

හැමෝම වෙනදා වගේම එකට එකතු වෙලා පාසලට යන්න පිටත් වුණා.



වෙනදා වගේම  පූස් තඩියත් කැලේ අස්සේ හැංගිලා මග බලන් හිටියේ මී රංචුව එනකල්.

මී රංචුව දකිද්දී පූස් තඩියාගේ කටට කෙළත් උණනවා..

ඔන්න දැන් මී රංචුව ළඟ ළඟම එනවා.

එකපාරටම පූස් තඩියා මේ මී රංචුව ළඟට කඩන් පැනලා එක මී පැටියෙක් කටට ගත්තා.

“ අනේ පූස් හාමි, ඔයා ඇයි මේ කොස් ඇටයක් තරම් වත් ලොකු නැති අපිව කන්න හදන්නේ... ? ඔයා දැක්කේ නැද්ද කැළේ මැද ඉන්න තඩි ම තඩි මී රංචුව..?”

නායක මීයා ඇහුවා.



පූස් තඩියා පුදුමයෙන් බලන් හිටියා.

“ ඇ.... තඩි ම තඩි මී රංචුව? ඒ කොහෙද ඉන්නේ ?” පූස් තඩියා කෑදර කමින් ඇහුවා.

“ අපිත් එක්ක යමුකෝ. අපි පෙන්නන්නම් එයාලා ඉන්න තැන.” එහෙම කියපු නායක මීයා මී රංචුවත් එක්ක පුස් තඩියා ව කැලේ මැදට එක්කගෙන ගියා.

එයාලා කලින්ම හදපු බොරු වළ ළඟ ලොකු කරලා පෙන්වන කණ්ණාඩියත් තියල තිබුණා.

මී පැටියෙක් දුවලා ගිහින් කණ්ණාඩිය ඉස්සරහා හිට ගත්තා. කණ්ණාඩියෙන් මී පැටියාව ලොකු වෙලා පෙනුණා.



“දැක්කා නේද පූස් හාමි...මේ ලොකු රවුම ඇතුළේ ඉන්න මීයාගේ ලොකු?

මේ රවුම ඇතුළේ තව මේ වගේ ලොකු මීයෝ ගොඩාක් ඉන්නවා. රවුම ඇතුළට ගියොත් ඔයාට බඩ පැලෙනකන් මීයෝ කන්න පුළුවන්.” නායක මීයා කිව්වා.

මෝඩ පූස් තඩියා මේ කතාවට රැවටුණා. තඩි මීයන් කන්න කියලා හිතලා කණ්ණාඩිය දිහාවට දුවන්න ගත්තා.

එතකොටම පූස් තඩියා බොරු වළට ඇදගෙන වැටුණා.



පූස් තඩියාට එළියට එන්න බෑ.... මී රංචුවට හරිම සතුටුයි...

"දැන් අපි නිදහස්" එයාලා සතුටින් කෑ ගැහුවා...

"අනේ.... මී පැටව්නේ...මාව එළියට ගන්න..." පූස් තඩියා කෑ ගහනවා.

මේ කෑ ගැහිල්ල අහලා මී රංචුවටත් දුකයි. ඒත් එළියට අරගෙන කොහොමද? ආයෙත් එයාලව කන්න පටන් ගනීවි නේ....

රංචුවේ අනිත් අයත් එක්කත් මොන මොනවද කුටු කුටු ගගා කතා කරපු නායක මීයා වළට එබිලා පූසාගෙන් මෙහෙම ඇහුවා...

" අපිට ගුරුතුමිය කියලා දීලා තියෙන්නේ හැමෝටම කරුණාවන්ත වෙන්න කියලා... නපුරු වැඩ කරන්න එපා කියලා. එත් අපි ඔයාව එළියට ගත්තොත් ඔයා අපිව කාලා දමාවි නේ......?"

පූසා බැගෑපත් වුණා. "අනේ මට උදව් කරන්න. මම ආයෙත් කවදාවත් ඔයාලව කන්නේ නෑ.. මම පොරොන්දු වෙනවා. අපි යාලුවෝ වෙමු." පූසා කිව්වා.

මී රංචුව පූසාව එළියට ගන්න තීරණය කළා.


වළ ඇතුළට වැල් පොටක් දාලා පූසාට ඒක අල්ලා ගන්න කියලා හැමෝම එකතු වෙලා ඇද්දා.



පූසා වළෙන් එලියට ආවා. මී රංචුවෙන් සමාව ඉල්ලුවා. හැමෝම යාළු වුණා.

මී රංචුව ආයෙත් සතුටින් ඉස්කෝලේ ගියා.





දැක්කා නේද යාලුවනේ...? පාසලේදී ඉගෙන ගන්න දේවල් හොඳින් මතක තියා ගත්තොත් අපේ ජීවිතයේදී එන ප්‍රශ්න වලදී විසඳුම් හොයන්න පුළුවන්... නේද?

ඒ වගේම කරුණාවන්ත වුණොත් අපිට හැමෝමත් එක්ක සතුටින් ඉන්න පුළුවන්.

පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහු විධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය. දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක වී සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර සාධකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාසිංශන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්